# විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය

නෝනාවරුනි, මහත්වරුනි,

වර්තමාන මනුෂ්‍යයා ස්වකීය ජීවිතයේ එක අංශයකින් ඉතා උසස් තත්ත්වයකට පැමිණ සිටින අතර තවත් අංශයකින් එතරම් දියුණුවකට පැමිණ නැත. මේ දෙකටම ප්‍රධාන හේතුව අධ්‍යාපනයයි. මනුෂ්‍ය වර්ගයේ අනික් සියලුම ක්‍රියා මෙන්ම අධ්‍යාපනය ද සර්ව සම්පූර්ණ එකක් නොවේ. සමහර අංශවලින් අධ්‍යාපනය පුදුම දියුණුවක් ලබා ඇත. මනුෂ්‍යයා දියුණු වී ඇත්තේ අධ්‍යාපනයේ ඒ කොටස නිසා ය. මනුෂ්‍ය ජීවිතයේ එක අංශයක් පිරිහීමට පත් වී ඇත්තේ ද අධ්‍යාපනයේ එම අංශය දියුණු වී නැති නිසා යයි පිළිගත යුතුව ඇත. මේ අංශ දෙක ගැනම හැකිතාක් අපක්ෂපාත භාවයකින් යුක්තව සොයා බැලීමත් ඊට නිසි ප්‍රතිකර්ම යෙදීමත් විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයේ යුතුකමත් වගකීමත් විය යුතුව පවතී.

භෞතික ය ආධ්‍යාත්මික යයි එකිනෙකට වෙනස් වූ අංශ දෙකකට මනුෂ්‍යයා බෙදීමට පුලුවන් කමක් නැත. ආහාර නොමැති කම, ජීවත් වීමට සුදුසු ගෙයක් නොමැති වීම ආදී භෞතික හේතු වලින් පෙළෙන මිනිසාට ආධ්‍යාත්මික සුවය ගැන සිතන්ට වෙලාවක් නැත. ඔහු දුක් විඳින මිනිසෙකි. එසේම කොතරම් හොඳට ආහාරපානාදිය තිබෙතත් කොතරම් හොඳ ගෙයක ජීවත් වුවත් යමෙකුගේ සිත නොසන්සුන් නම් නොයෙකුත් කරදර වලින් යුක්ත නම් ඒ තැනැත්තා ද දුක් විඳින මිනිසෙකි. අධ්‍යාපනයෙහි පරමාර්ථය විය යුතු වන්නේ ශාරීරික වශයෙනුත් මානසික වශයෙනුත් සුවපත් වූ මිනිස් සමාජයක් බිහිකරවීම ය. එවැනි සමාජයක් බිහි කරවීමට ශක්තිය ඇත්තා වූ ද සුදුසු වූ ද ආයතනය විශ්වවිද්‍යාලයයි. එහෙත් අභාග්‍යයකට මෙන් වර්තමාන ලෝකයේ කිසිම රටක ඇති විශ්වවිද්‍යාලයකින් එම කාර්‍ය්‍යය සතුටුදයක අන්දමකින් කෙරෙන බවට සාක්ෂි නැත.

විශ්වවිද්‍යාලය වනාහි රටක තිබෙන උසස්ම අධ්‍යාපනික ආයතනය යයි. රටක සිටින ඉගෙනීමට ඉතාම දක්ෂ තරුණ පිරිස සිටින්නේ ද විශ්වවිද්‍යාලයෙහි ය. එමෙන්ම නුදුරු අනාගතයෙහි දී රටේ සියලුම වගකිවයුතු තැන් ලැබීමට සිටින්නේ ද අද විශ්ව විද්‍යාලයවල ඉගෙනීම ලබන පිරිස ය. එහෙයින් විශ්වවිද්‍යාලයකින් දෙනු ලබන අධ්‍යාපනය මනුෂ්‍ය ජීවිතයේ එක අංශයක් පමණක් සකස් කරන්නක් නොව පූර්ණ අධ්‍යාපනයක් විය යුතු ය. ඉතා උසස් උපාධි ලැබූ එහෙත් වංචනික හෝ කෲර හෝ දුශ්චරිතයෙහි ගැලුණු හෝ උගතුන් දක්නට

ලැබෙන්නේ ඒ අය ලත් ඉගෙනීම අසම්පූර්ණ බැවින් ය. විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය ඥානවර්ධනයට පමණක් සීමා වී චරිත වර්ධනය නොසලකා හැර තිබීම අභාග්‍යයකි. සැබෑ ඉගෙනීමෙන් ඥානවර්ධනයත් චරිත වර්ධනයත් යන දෙකම එක විට සිදු වෙනවා ඇත.

පාලි භාෂාවෙහි තිබෙන ''සික්ඛා'' (සංස්කෘත 'ශික්ෂා') යන වචනය ගැන මෙහි දී යමක් කීම අවශ්‍ය ය. සික්ඛා යන වචනයෙහි තේරුම් දෙකක් තිබේ. එයින් එකක් ''ඉගෙනීම''ය. අනික ''හික්මීම''ය. ''සික්ඛති'' යනු ''ඉගෙන ගනියි'', එසේම ''හික්මෙයි''. ඉංග්‍රිසි භාෂාවෙහි ''ඩිසිප්ලින්'' (Discipline) යන්න ද මීට බොහෝසෙයින් සමාන ය. එහි ද ඉගෙනීම, හික්මීම යන අර්ථ දෙකම තිබේ.

ඉගෙනීමෙන් හික්මීම ඇති වෙනවා නොව ඉගෙනීමම හික්මීම වන්නේය. මෙය සිදු වන්නේ කෙසේ දැයි දැකීමට ඉගෙනීම ඇති වන සැටිත් හික්මීම ඇති වන සැටිත් අප විසින් පළමුකොට තේරුම් ගත යුතු වේ.

ඉගෙනීම යනුවෙන් පොදු ජනයා අදහස් කරන්නේ ඥානවර්ධනයයි හෙවත් දැනුම වැඩි කර ගැනීමයි.

මේ අර්ථයෙන් වන ඉගෙනීමෙහි පළමුවෙනි පියවර යම් කිසි දෙයක් පිළිගැනීමයි. ඒ පිළිගැනීමෙහි අවබෝධයක් නොමැතියි. කුඩා ළමයා තම පරිසරයෙන් වචන අහුලා ගනියි. ඒ වචන ඔහුගේ මොළයෙහි සටහන් වෙයි. මුළු භාෂාවක් ඉගෙනීම සඳහා ඔහුට අත්තිවාරම වන්නේ එසේ ප්‍රඥප්ති වශයෙන් පිළිගෙන තැන්පත් කර ගත් ඒ වචන සමූහයයි. පසු කලක දී ඔහුට අලුත් වචනයක් ඇසෙයි, එසේ නැත් නම් ඔහු අලුත් වචනයක් පොතක දකියි. ඒ අලුත් වචනය ඔහු තේරුම් ගන්නේ එම වචනය තමා කලින් තැන්පත් කරගෙන තිබුණු වචනවලට පරිවර්තනය කර ගැනීමෙන් ය. නොදන්න වචන දැන ගැනීමට අකාරාදියක් හෙවත් ශබ්දකෝශයක් පාවිච්චි කරනවා යයි කියන්නේ මෙම ක්‍රියාවලියට ය. අන්‍ය භාෂාවක් ඉගෙන ගන්නවා යයි කියන්නේ ද අලුත් අවබෝධයක් ඇති කර ගන්නවා නොව එකම දෙයට වචන දෙකක් කියන්ට සමර්ථකමක් ඇති කර ගැනීම ය. එසේම භාෂා පනහක් ඉගෙන ගන්නවා යයි කියන්නේ එකම දෙය පනස් විදියකින් කියන්ට හැකි වීම ය. කලින් ඔහු එක්තරා සතෙකු හැඳින්වීමට දැන සිටියේ ''බළලා'' යන වචනයෙන් පමණ ය. දැන් එකට එකක් වෙනස් වචන පනහකින් බළලා හැඳින් වීමට ඔහුට පුලුවන. මෙහි දී ඔහු වචන රැස් කර ගත්තා පමණ ය. මෙහි දී ඔහුගේ ඉගෙනීම දියුණු වූවා මිස අවබෝධයේ වැඩි වීමක් වත් ගුණධර්මයක පහළ වීමක් වත් සිදු වූයේ නැත. භාෂාව සම්බන්ධයෙන් පමණක් නොව ඕනෑ ම ශිල්ප ශාස්ත්‍රයක් ඉගෙන ගැනීමෙහි දී සිදු වන්නේද මීට සමාන වූවකි, එනම් පිටස්තරයෙහි තිබෙන දේවල් වචනවල ස්වරූපයෙන් හෝ සංකේතවල ස්වරූපයෙන් හෝ තමාගේ මොළයේ තැන්පත් කරගැනීමකි. එවැනි ඉගෙනීමකින් කෙනෙකු වචන මට්ටමේ උගතෙකු, බහුශ්‍රැතයෙකු, විශේෂඥයෙකු, වන්ට පුලුවන. එවැනි උගත්කමින් ප්‍රයෝජන නැත්තේ නොවේ. භෞතික යයි සම්මත ජීවිතයට එය බොහෝ සෙයින් ප්‍රයෝජනවත් වන්ට පුලුවන. බාහිර ඔපයක් සහ බාහිර සුවිනීතභාවයක් ද එවැනි උගත් කමින් ඇති

වන්ට පුලුවන. එහෙත් මනුෂ්‍යයා තුළ දයාව, අනුකම්පාව, වැනි මිනිස් ගුණ එයින් හටගන්නේ නැත. එහෙයින් දයාවෙන් තොර වූ ඒ උගතා මනුෂ්‍යයාගේ විනාශය සඳහා ද තම ඥානය යොදවන්ට පුලුවන. අද ලෝකයට උගත්කම නිසා සිදු වී ඇති විපත මෙයයි.

'සික්ඛා' යන්නෙන් ප්‍රකාශ වන අනික් අර්ථය වන හික්මීම ද බොහෝ විට වරදවා තේරුම් ගෙන තිබෙන වචනයකි.

භය නිසා ඇති වන හික්මීම සැබෑ හික්මීම නොවේ. එසේ ම පෙළඹීමක් නිසා , ලාභයක් බලාපොරොත්තුවක් නිසා ඇති වන හික්මීම ද හික්මීම නොවේ. දෘෂ්ටියක් නිසා, ව්‍රතයක් නිසා, ඇති වන හික්මීම ද හික්මීම නොවේ. එවැනි හේතුවක් නිසා ඇති වන හික්මීම තාවකාලිකය. හේතුව නැතිව ගිය විට ඒ හික්මී ම ද නැතිව යන්නේය. සැබෑ හික්මීමෙහි කැඩීමක්, බිඳීමක්, පලුදුවීමක්, නැති වී යාමක්, නැත. එය ඇති වන්නේ යම් කිසි ක්‍රියාවක් අශෝභන බව, අහිතකර බව, වැරදි බව, ප්‍රත්‍යක්ෂ වශයෙන් දැකීමෙන් ය.

උගත්කම යනුවෙන් අප සාමාන්‍යයෙන් අදහස් කරන්නේ යමක් අසා, බලා, කියවා ඒ දෙය මතක තබාගැනීම ය, ඒ දෙය ගැන තර්ක කරන්ට විමසා බලන්ට නිශ්චය කරන්ට පුලුවන්කමක් ඇති කර ගැනීම ය. කලින් සඳහන් කළාක් මෙන් ඒ ඉගෙනීම කරුණු රැස්කර ගැනීමකි. නිවැරදි දෙය මෙන් ම වැරදි දෙය ද ඒ රැස්කර ගැනීමෙහි ඇතුළත් වන්ට පුලුවන. තවද මතක-යෙහි තැන්පත් වුණු දෙයක් හෙයින් ඉගෙන ගත් දෙය නිතරම පරණ ය.

කරුණු රැස්කර ගැනීමේ අපේක්ෂාවෙන් කෙරෙන මෙම ඉගෙනීමට වඩා වෙනස් වූ තවත් ඉගෙනීමක් තිබේ. ඒ වනාහි යමක් දෙස අලුතෙන් බලා එහි යථා ස්වභාවය හෙවත් ඇති සැටිය දැකීමකි. ඒ බැලීමෙහි පූර්ව නිගමන නැත. යමක යථාස්වභාවය දැකීමට පූර්ව නිගමන බාධාවකි. විද්‍යාඥයා යම් සියුම් දෙයක් දෙස අණ්වීක්ෂ කණ්නාඩියෙන් බලන්නේ පූර්වනිගමන ඇතිව නොවේ. පූර්වනිගමනයෙන් යුක්තව බැලීම අලුත් දෙයක් සොයා ගැනීමෙහි දී බාධාවකි.

අඳුරේ ගමනක් අප යනවා යයි සිතමු. ඉස්සරහට තිබෙන දේ කිසිවක් අපට නොපෙනෙන හෙයින් අපේ ජීවිත ගමන ද අඳුරේ යන ගමනකි. මාර්ගයෙහි වළවල් තිබෙන්ට පුලුවන, ගොඩැලි තිබෙන්ට පුලුවන, කටු ගල් බොරළු ආදිය තිබෙන්ට පුලුවන, ක්ෂේමස්ථානද අතරින් පතර තිබෙන්ට පුලුවන. එසේම මාර්ගයෙහි නයි පොළොංගු වැනි විසකුරු සතුන් සිටින්ට පුලුවන, අහිංසක සතුන් ද සිටිනට පුලුවන. අඳුරේ යන අපට ඒ කිසිවක් පෙනෙන්නේ නැත. අප ආධාර කර ගන්නේ අනුන් විසින් දෙන ලද ගමන් විස්තරයෙකි. හොඳ නරක, කළයුතු දේ සහ නොකළයුතු දේ යනාදී වශයෙන් අප ගුරුවරුන්ගෙන්, පොත පතින්, ඉගෙන ගත්ත දේ එම ගමන් විස්තරයයි. අප ගමන් කරන්නේ අඳුරෙහි හෙයින් එම විස්තරයෙහි අඩංගු දේ අපට ප්‍රත්‍යක්ෂ නැත. එහෙයින් ගොඩ කොතැන ද වළ කොතැන දැ යි අප හරිහැටි දන්නේ නැත. එහෙයින් ම නොයෙකුත් ව්‍යසනවලට මුහුණ පාන්ට අපට සිදු වෙයි. ඉගෙනගත් හොඳ නරක අපේ ප්‍රත්‍යක්ෂයන් නොවන හෙයින්, ජීවිත ගමනෙහි දී අප නොමග යවන්ට ඒ මාර්ග විස්තරය හේතු වන්ට පුලුවන. මෙය වර්තමාන ලෝකයෙහි ඉතා පැහැදිලිව දක්නට තිබෙන දෙයකි.

ඉතාම ඉහළට ඉගෙන ගත් අය පවා දුශ්චරිතයෙන් වෙළුණු ඉතාම පහත් ජීවිත ගත කරනු නොයෙක් විට අපට දක්නට ලැබෙන්නේත් ඇතැම් රටවල උසස් ආගමික නායකයන් පහත් කෲර මිනීමරන්නවුන් වී සිටිනු දක්නට ලැබෙන්නේත් එහෙයිනි. එවැනි ඉගෙනීමකින් මනුෂ්‍ය වර්ගයාට පිහිටක් නැත.

අඳුරේ යන විට අප අතේ එළියක් තිබෙනවා නම් මේ අවාසනාවන්ත තත්ත්වය අපට සිදු වන්නේ නැත. මෙ සම්බන්ධයෙන් අපට ලබාගත හැකි එළිය වනාහි දැකීමත් සමගම හික්මීම ඇති කරවන ඉගෙනීම ය.

ඉතා කුඩා දෙයක වුව ද ඇති සැටිය අපට පෙනුනු විට ඒ දෙය සම්බන්ධයෙන් අපේ හැසිරීම සහමුලින් වෙනස් වන්නේය. බෝතලයෙහි ''විස'' යන ලේබලය දැකීමෙන් පසු එය අතපත ගාන්නේ කවු ද ? පාරෙහි තිබෙන කුණු කසළ ඇහේ තවරා ගන්නේ සිහිය ඇති කවරෙක් ද? සත්ත්වහිංසාවෙහි ඇති කෲරභාවය දුටු තැනැත්තා කිසි කලෙක සතුන් මරන්නේ නැත. බොරු කීම අනුන් රැවටීම, අපවිත්‍ර ක්‍රියා බැව් දකින තැනැත්තා බොරු කියන්නේ නැත, අනුන් රවටන්නේ නැත. නොකළ යුතු ඒ ඒ දේ නොකරන්නේ භයක් නිසා නොව ඒවා නොකළ යුතු බැව් පැහැදිලි නිසාය. මේ පැහැදිලි බව නියම ඉගෙනීමේ ඒකාන්තය ඵලයයි.

අප අසන, කියවන, දකින, කරන, දේ තත්ත්වාකාරයෙන් ප්‍රත්‍යක්ෂව දැකීමේ අවංක ඕනෑකම්ම ඒ ඒ දේ පිළිබඳ අවධානයත් ආලෝකය දල්වා ගැනීමත් වන්නේය. සංසන්දනය කිරීමක්, විතර්ක කිරීමක්, පිළිගැනීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් එහි නැත. තිබෙන්නේ අවධානයත් ආලෝකයත් පමණ ය. යමක් සාරවත් ද නැත හොත් නිස්සාරද යි එම ආලෝකයට පෙනෙයි. ඔහු ඒ වූ පරිද්දෙන් හැසිරෙයි, ඒ හැසිරීම සැබෑ හික්මීම ය. එසේ හික්මුණු තැනැත්තාගේ ජීවිතය විධිමත් ය, අහිංසක ය.

ලෝකයෙහි සාමය ඇති වන්නේ එලෙස ඉගෙනගත් හික්මුණු අය නිසා ය. විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය විය යුත්තේ එසේ ඉගෙනීමත් හික්මීමත් එකවිට ඇතිකරවන, 'සික්ඛා' යන වචනයෙන් ඉතා හොඳින් ප්‍රකාශ වන පූර්ණ අධ්‍යාපන යයි. කරුණු ඉගෙනීමෙන් පමණක් නොව හික්මීමෙන් ද යුත් ඒ පූර්ණ අධ්‍යාපනය ශිෂ්‍යයන්ට දීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමර්ථවේවායි ප්‍රාර්ථනා කරමි.